මගේ අංකය : JSC/SEC/CIR-L/2023

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක: 03/2023**

සියලුම විනිශ්චයකාරවරුන් සහ සියලුම අධිකරණ නිලධාරීන් වෙත,

<u>විෂ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා ඇතුලත් කිරීම.</u>

ශීර්ෂගත කරුණට අදාලව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (නීති) පියුමන්ති පීරිස් මහත්මිය විසින් මා අමතා ඇති අංක : MOJ/L 13/JSC/2020 හා 2023.01.11 දිනැති ලිපිය හා ඊට අමුණා තිබූ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්, මේජර් ජෙනරල් (විශ්‍රාමික) ඩී.ඩී.යූ.කේ. හෙට්ටිආරච්චි මහතා විසින් පොලිස්පති අමතා ඇති 2022.12.23 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එම ලිපිය හා ඇමුණුම අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පලකොට ඔබගේ අවධානයට ලක්කරන ලෙසට මට නියම කර ඇත.

02. ඒ අනුව, එම ලිපිය හා ඇමුණුම අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පලකොට ඔබගේ අවධානයට ලක්කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2023 ජනවාරි මස 31 වන දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

ලේකම් දුරකථනය
செயலாளர் தொலைபேசி 2449959
Secretary Telephone
ෆැක්ස් අංකය
பெக்ஸ் இல. 2445447
Fax No.

E-Mail: secretary@moj.gov.lk

ප්‍රධාන කාර්යාලය දුරකථනය
பொது அலுவலகம் தொலைபேசி 2323022
General Office Telephone
ෆැක්ස් අංකය
பெக்ஸ் இல. 2320785
Fax No.

Web Site: www.moj.gov.lk

**අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

**நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு**

**Ministry of Justice, Prison Affairs and Constitutional Reforms**

...பெட்டி
...ox. 555

ඉලෙක්ට්‍රොනික තැපැල
மின்அஞ்சல் info@moj.gov.lk
E-mail

නො 19, ශ්‍රී සංඝරාජ මාවත
කොළඹ 10

இல 19, ஸ்ரீ சங்கராஜ மாவத்த
கொழும்பு 10

No 19, Sri Sangaraja Mw
Colombo 10

මගේ අංකය / எனது இல / My No. MOJ/L13/JSC/2020

ඔබේ අංකය / உமது. இல. / Your No.

දිනය / திகதி / Date 11 .01.2023

B/4 12 JAN 2023

ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

<u>විෂ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා ඇතුලත් කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන්, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් විසින් මෙම අමාත්‍යාංශයටද පිටපතක් සහිතව එවන ලද පුනකොජ/ප්‍ර/01/01/125 අංක දරන 2022 දෙසැම්බර් මස 23 දිනැති ලිපිය හා බැඳේ.

අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් ප්‍රකාරව, ඉහත ලිපියේ පිටපතක් විනිසුරුවරුන් දැනුවත් කිරීම පිණිස මේ සමඟ අමුණා එවමි.

පියුමන්ති පීරිස්
අතිරේක ලේකම් (නීති)
ලේකම් වෙනුවට
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

පිටපත - අධ්‍යක්ෂක, විනිසුරුවරුන් පුහුණු කිරීමේ ආයතනය. (පිටපත අමුණා ඇත.)

පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය
புனர்வாழ்வு ஆணையாளர் நாயகம் பணியகம்
BUREAU OF THE COMMISSIONER GENERAL OF REHABILITATION
අධිකරණ,බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு
MINISTRY OF JUSTICE, PRISON AFFAIRS AND CONSTITUTIONAL REFORMS

අංක : 462/2 , කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල.
இல : 462/2இ கடுவெல வீதி, கனஹேன, பத்தரமுல்ல.
No. 462/2 , Kaduwela Road , Ganahena , Battaramulla.


මගේ අංකය / எனது இல: / My No. පුනකොජ/ප්‍ර/01/01(125)

ඔබේ අංකය / உமது இல: / Your No.

දිනය / திகதி / Date 2022.12.23

පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

ගරු පොලිස්පති තුමණි,

<u>විෂ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා ඇතුළත් කිරීම.</u>

යොමුව:
අ. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් තුමිය සමග 2022.12.23 වන දින පැවති සාකච්ඡාව.

1. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කර යහපත් පුද්ගලයන් වශයෙන් සමාජගත කිරීම මෙම කාර්යාංශය විසින් සිදු කරනු ලබන අතර ඒ සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය කන්දකාඩු, තාක්ෂණික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය සේනපුර හා ඒකාබද්ධතා මධ්‍යස්ථානය වව්නියාව පවත්වා ගෙන යනු ලැබේ.

2. මෙම පුනරුත්ථාපන මධ්‍යස්ථාන තුනෙහි දළ වශයෙන් පුනරුත්ථාපනලාභීන් 1100 ක පමණ ප්‍රමාණයක් එකවර පුනරුත්ථාපනය සඳහා යොමු කළ හැකි අතර, දැනට පුනරුත්ථාපනලාභීන් 500 දෙනෙකු පමණ පුනරුත්ථාපනය වනු ලබයි. ඒ අනුව පුනරුත්ථාපනලාභීන් **600 ක පමණ ප්‍රමාණයක්** තවදුරටත් ඇතුළත් කර ගැනීමේ හැකියාවක් ඇති බැව් දන්වා සිටිමි.

3. තවද මෙම පුනරුත්ථාපන ක්‍රියාවලිය මාස 06 ක කාල සීමාවක් තුළ සිදු කරනු ලබන බැවින් මාස 06 ක කාල සීමාව අවසානයේ සමාජගත කරනු ලබන පුනරුත්ථාපනලාභීන් ප්‍රමාණයන් අනුව අඛණ්ඩව පුනරුත්ථාපන සඳහා යොමු කිරීමේ හැකියාවක් පවතී.

4. එහෙත් විවිධ පොලිස් ස්ථාන විසින් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට හැකියාවක් තිබේද යන්න මෙම කාර්යාංශය වෙතින් නිතර නිතර විමසනු ලබන අවස්ථා ඇති බැවින් ඉහත යොමුගත සාකච්ඡාවේදී අධිකරණ අමාත්‍යාංශයේ ගරු ලේකම් තුමිය වෙතින් ලැබුණු උපදෙස් ප්‍රකාරව සියළු පොලිස් ස්ථාන දැනුවත් කර විෂ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

5. නොමග ගිය පිරිස් යහමගට ගැනීම සඳහා ක්‍රියාත්මක මෙම ජාතික අවශ්‍යතාවය සාර්ථක කර ගැනීම සඳහා ඔබතුමා වෙතින් නිරන්තරයෙන් දක්වන සහයෝගය ඉතා අගය කොට සළකමි.

ඩී ඩී යූ කේ හෙට්ටිආරච්චි ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී එම් ඒ
මේජර් ජෙනරාල් (විශ්‍රාමික)
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්

පිටපත් :
1. ලේකම් - අධිකරණ අමාත්‍යාංශය


පොදු / பொது / General +9411 2577457 / +9411 2883891
ෆැක්ස් / தொலைநகல் / Fax +9411 2883737 / +9411 2883899
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail bcg.rehabilitation@gmail.com
වෙබ් අඩවිය / இணையத்தளம் / www.bcgr.gov.lk